ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov http://lk.usembassy.gov

නිවේදන අංක: 20190227

එක්සත් ජනපද තානාපති කාර්යාලය මාතර ඇමෙරිකානු පියස අරඹයි

පෙබරවාරි 27, මාතර: ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා ඇමෙරිකානු තානාපතිනී ඇලෙයිනා ටෙප්ලිට්ස් සහ මුදල් අමාත්‍ය මංගල සමරවීරගේ සහභාගිත්වයෙන් පෙබරවාරි 26 දින මාතර අංක 149 දරණ ස්ථානයේ පිහිටි වාණිජ හා කර්මාන්ත මණ්ඩල ගොඩනැගිල්ලේදී මාතර නව ඇමෙරිකානු පියස විවෘත විය.

මාතර ඇමෙරිකානු පියස ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය සඳහා සහය වන අතර ශ්‍රී ලංකාවේ දීප්තිමත් තරුණ පරපුරට නව සොයාගැනීම් පිළිබඳ තම සංකල්ප යථාර්තයක් කර ගැනීමට අවශ්‍ය සම්පත් සහ අවකාශය මෙන්ම එක්සත් ජනපදය පිලිබඳව තොරතුරුද ලබා දෙයි. එසේම මේ මගින් ව්‍යවසායකත්වය,ඉංග්‍රීසි කුසලතා සහ පරිගණක කේතකරණය පිළිබඳ පාඨමාලාද පවත්වනු ලබන අතර මහනුවර, යාපනය සහ කොළඹ පිහිටි අනෙකුත් මද්‍යස්ථාන සමග එක්ව කටයුතු කරයි.ඇමෙරිකානු මද්‍යස්ථානයන්හි පැවැත්වෙන සියලුම පාඨමාලා නොමිලේ පවත්වනු ලබන අතර ඒවාට සහභාගිවන්නන් මද්‍යස්ථානයන්හි තරුණ කවයන්ගේ සාමාජිකයන් වනු ඇත. අඟහරුවාදා සිට ඉරිදා දක්වා සෑම දිනකම පෙරවරු 9:00 සිට පස්වරු 5:30 දක්වා මාතර ඇමෙරිකානු පියස විවෘතව පවතී.

ඇමෙරිකන් පියස සංකල්ප සංවර්ධන මද්යස්ථානයක් ලෙස හැඳින්වූ තානාපතිනී ටෙප්ලිට්ස් වැඩිදුරටත් පැවසුයේ දකුණු පළාතේ සිටින තරුණ තරුණියන්ට මෙම මද්‍යස්ථානයේ ඇති 3ඩී මුද්‍රණ යන්ත්‍ර මගින් ආකෘති මුද්‍රණයට, ව්‍යාපාරික ඉංග්‍රීසි ඉගෙනගැනීමට, කේතකරණය ඉගෙන ගැනීමට හා ඒ මගින් ආදායම් උපයා ගැනීමට හා සමාජ මාධ්‍යය මගින් තම ව්‍යාපාර සහ වෙළඳ නාම ප්‍රචාරණය කර ගැනීමට අවස්ථාව ලැබෙන බවයි.

මෙහිදී අදහස් පල කරමින් අමාත්‍ය මංගල සමරවීර පැවසුයේ මෙම මාතර ඇමෙරිකානු පියස ආරම්භ කිරීම දකුණු පළාතේ තරුණ තරුණියන් තුළ ඇමෙරිකානු සංස්කෘතිය පිලිබඳව ඉගෙනීමට හා ජාත්‍යන්තර ක්‍රියාකාරකම් සම්බන්ධ කේන්ද්‍රස්ථානයක් බවට මාතර පත් කර ගැනීමේ දීර්ඝ කාලීන සිහිනයක් මල්පල ගැන්වීමක් බවය. තානාපතිනී ටෙප්ලිට්ස් සහ අමාත්‍ය සමරවීර යන දෙදෙනාම මාතර ඇමෙරිකානු පියස ස්ථාපිත කිරීම සඳහා හවුල් වීම පිලිබඳව මාතර වාණිජ හා කර්මාන්ත මණ්ඩලයට තම ස්තූතිය පල කළහ.